31

# පොළොන්නරු ස්තූපයන්හි ආකෘතියේ විශේෂතා

*ඩී. කේ. නදීශා දිල්ෂානි* [1]
*ටී. එම්. එච්. කේ. තෙන්නකෝන්* [2]
HS/2013/0222, HS/2013/1068

පොළොන්නරු ස්තූපයන්හි පෙනෙන ලක්ෂණයක් ලෙස ස්ථර එකකින් හෝ දෙකකින් සමන්විත පිහිටි භූමියෙන් උස්ව සෑදූ වේදිකාවක් මත ස්තූපය ඉදිකිරීම කැපි පෙනේ. තවද අනුරාධපුර යුගයට අයත් ස්තූපවල විශේෂ ලක්ෂණයක් ව තිබූ වාහල්කඩ වෙනුවට සිව් දිශාවට මුහුණලා ඉදි වූ ප්‍රතිමා මන්දිර ද දැකිය හැකි වේ. මෙසේ ස්තූපයට සමගාමී ව ප්‍රතිමාවක් ඉදි කිරීමේ සංකල්පය බෞද්ධාගමට අවතීර්ණ වූයේ මහායාන බෞද්ධාගමික බලපෑම මත බව ප්‍රකට කරුණකි. සිව් දිශාවට මුහුණලා ඇති ප්‍රතිමා මන්දිරවල ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට අමතරව දෙපසින් බෝධිසත්ව ප්‍රතිමා දෙකක් ඉදි වූ බවටද සාධක ලැබී ඇත. මෙම ප්‍රතිමා මන්දිර ඉදි කිරීමේදී ගෙඩිගේ සම්ප්‍රදායට අයත් ගොඩනැගිලි වහලය පිරමීඩාකාර ආකෘතියෙන් යුක්තව ඉදි කරනු ලැබීම ඉන්දියාවේ පල්ලව ගෘහ නිර්මාණ ශිල්පයේ කැපී පෙනෙන ලක්ෂණයකි. එමෙන්ම හතරැස් කොටුවට අමතරව ස්තූපයේ කොත්කැරැල්ලට දේවතාකොටුව එක්වීම කැපි පෙනේ. මෙය ද හින්දු ආගමික බලපෑම මත ස්තූපයට ඇතුළත් වූ අංගයක් ලෙස සලකනු ලැබේ. දේවතා කොටුව සතරවරම් දෙවිවරුන් වෙනුවෙන් ඉදි වූ අංගයක් බව ඇතැම් ඉතිහාසඥයන්ගේ මතය යි. මෙහි සිව් දිශාවට මුහුණලා ආරක්ෂිත දේවරූප හතරක් කැටයම් කර තිබේ. එමෙන්ම පොළොන්නරු ශිල්පියා තමන්ට ආවේණික අයුරින් සඳකඩපහණ, මුරගල, කොරවක්ගල නිර්මාණය කර තිබේ. රන්කොත්වෙහෙර, පබළුවෙහෙර, කිරිවෙහෙර ආදි ස්ථානවලින් ලැබී ඇති සඳකඩපහණ හා මුරගලවලින් මෙකී ලක්ෂණ තහවුරු වේ. පොළොන්නරු ස්තූපයන්හි පොදු ලක්ෂණ සලකා බලන විට පොළොන්නරු ශිල්පියා තමාට ආවේණික ස්තූප නිර්මාණය කර ඇත. එමෙන්ම හින්දු ආගමික බලපෑම ද මහායානික බෞද්ධාගමික බලපෑම ද පොළොන්නරු රාජධානියෙහි ස්තූප නිර්මාණකරණයෙහි දී බලපා ඇති බව පෙනේ. දීර්ඝ කාලයක් පැවති චෝලයන්ගේ පාලනයත් පොළොන්නරු රාජධානිය මහායාන බෞද්ධ ආගමික කේන්ද්‍රස්ථානයක් ලෙස පැවතීමත් මේ සඳහා හේතු වී ඇති බව මේ අනුව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ස්තූප, පොළොන්නරුව, වටදාගෙය, මහායාන බුදුදහම, ගෙඩිගේ

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර*

*2 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර*